07-10-2021 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, පාප නොඅසන්න! එකම පරම පියාට පමණක් කන් දෙන්න. ගෙදර ජීවත් වන අතරවාරයේ නෙළුම් මලක් හා සම වෙන්න.

**ප්‍රශ්නය:** කුමන නාටකය ගැන හරි හැටිම දැන ගැනීම නිසාද දරුවන් කිසිවිටෙක පටලැවිල්ලට පත් නොවන්නේ.

**පිළිතුර:** සතුට සහ දුක, ඥානය සහ භක්තිය පිළිබඳ හරියටම දන්නා අය කිසිවිට පටලැවිල්ලට පත් නොවේ. ඔබ දන්නවා දෙවියන් වන පරම පියා කිසිවිටෙක කිසිවෙකුට දුකක් නොදේ. ඔහු දුක දුරුලන්නා සේම සතුට දානය කරන්නාය. හැම කෙනෙක් ම අසතුටට පත් වූ කල්හි, ඔහු පැමිණ ඔවුන් දුකින් මුදවා ගනී.

**ගීතය:** උදේ පාන්දරම මෙහි ආවේ කවුද...?

ඕම් ශාන්ති. ඔබ දරුවන්ට ඇසුනේ කුමක්ද? ඇසුනේ භක්තියේ ගීතයකි. භක්තියට ඉංග්‍රීසියෙන් කියන්නේ දර්ශනය කියාය. ඔවුන්ට දර්ශන මහාචාර්ය යන පදවිය ලැබේ. බාල මහළු සැවොම දර්ශනය (භක්තිය) දනී. ඔබ කාගෙන් හරි ඇසුවොත් දෙවියන් සිටින්නේ කොහිද කියා ඔවුන් කියාවි ඔහු සර්වව්‍යාපී කියා. එයද දර්ශනයකි. පරම පියා ඔබට ආගමික ලේඛණ වල කිසිවක් නොකියයි. බැතිමතුන් කිසිවකුට ඥාන සාගරය යැයි කිව නොහැක. කිසිවෙකුට ඥානය නැතිවා සේම ඔවුන් ඥාන සාගරයේ දරුවන්ද නොවේ. ඔවුන් කිසිවෙක් ඥාන සාගරය වන පරම පියා නොදන්නා සේම ඔහුගේ දරුවන් සේද නොගැනේ. ඔවුන් සැවොම දෙවියන් හමුවීම සඳහා භක්තියෙහි යෙදුනත් ඔවුන් පරමාත්ම දෙවියන් ගැන නොදන්නා අතර භක්ති කිරීමෙන් ඔවුන්ට වන යහපත කුමක්ද? බොහෝ අය දර්ශන ආචාර්ය උපාධිය ලබයි. ඔවුන්ගේ බුද්ධියේ ඇත්තේ එක දෙයක් වන අතර ඒ දෙවියන් සර්වව්‍යාපී බවය. ඔවුන් එය දර්ශනය සේ සලකයි. ඔවුන් පිරිහීමට පත් වූයේ මේ තුළිනි. එය ආගම අපහාසයට පත් වීමකි. අපට ආගමික ලේඛණ ගැන අන් අය සමඟ විවාද කළ නොහැක. අපි මේ ගැන මනුෂ්‍යයින්ගෙන් ඉගෙන ගෙන නැත. අන් සියලු මනුෂ්‍යයින් ඉගෙන ගන්නේ තවත් මනුෂ්‍යයින්ගෙනි. ඔවුන් වේද සහ වෙනත් ලේඛණ හදාරන්නේ මිනිසුන් සමඟය. ඒවා ලියා ඇත්තේ මනුෂ්‍යයින් විසිනි. මෙහිදී ඥානය ලබා දෙන්නේ එකම පරම පියා විසින් පමණි. ඔහු ඔබට විස්තර කිරීමට එක වතාවක් මෙහි පැමිණේ. දැන් අපිට මනුෂ්‍යයින්ගෙන් ඉගෙනගත යුතු කිසිවක් නැත. ඔබ දැන් ඇහුම්කන් දෙන්නේ ආධ්‍යාත්මික පියාට පමණි. ජීවාත්ම සත්තාවන් වන ආධ්‍යාත්මික දරුවන්ය ඔහුට කන් දෙන්නේ. අන් සෑම මනුෂ්‍යයෙක්ම කියා දෙන්නේ තවත් මනුෂ්‍යයින්ටය. මෙය ආධ්‍යාත්මික පරම පියාගෙන් ලැබෙන ඥානය වන අතර එය මනුෂ්‍යයෙක්ගෙන් ලබන දැනුමක් පමණි. මේ බාබා ද ශාරීරික මනුෂ්‍යයෙකි. ඔවුන්ට මෙසේ කියා දෙන්න ආධ්‍යාත්මික පරම පියා මොහු තුළින් විස්තර කරයි. භූතාත්මය වන මමද ඔහුට ඇහුම්කන් දී භූතාත්මය ලෙසින් එය අන් අයට ශරීරය යොදා කියා දෙයි. මෙය වූ කලී ආධ්‍යාත්මික ඥානයයි. අන් සියල්ල භෞතික වෙයි. භක්ති මාර්ගයේ දී ඔවුන් ශරීර වන්දනා කරයි. පරම පියා මෙසේ කියයි ඔබ කිසි විටෙක මනුෂ්‍යයෙක් හෝ බැතිමතෙක් ලෙස නොගන්න. ඔබ ජීවාත්ම සත්තාවක් බව සලකා ඔබේ පරම පියා වන මා සිහිකරන්න. ඔබ ජීවාත්ම සත්තාවන් සොයුරන්ය. ජීවාත්ම සත්තාවන් පරමාත්මයෙන් බොහෝ දිගු කලක් වෙන් වී සිටි බව කියැවේ. ඔබ මනුෂ්‍යයින්ට කන් නොදී සිටින්න. කවුරු හෝ ඔබ ප්‍රශ්න කළොත් කියන්න ඔබේ ඥානය කිසිම ආගමික ලේඛණයකින් නොගත්ත එකකි බව. භක්ති මාර්ගයේ ඥානයට අප කියන්නේ දර්ශනය කියාය. ගැලවීම සඳහා ඥානය ඔබට ලබා දෙන්නේ එකම පරම පියාම පමණි. සැමගේම ගැලවීම ලබා දෙන්නා ලෙස සලකන්නේ ඒ ඒකායන තැනැත්තා පමණි. ඔබ දරුවන් කිසිවෙක් කා සමඟවත් විවාදයට නොයා යුතුයි. පරම පියා මෙසේ කියයි මා ඥාන සාගරය වන අතර ඥානය පිළිබඳ අධිකාරිය වෙමි. මම ඔබට කිසිම ලේඛණයක් කියා නොදෙමි. මගේ මේ ඥානය ආධ්‍යාත්මික වන අතර අනෙක් දැනුම් සියල්ල භෞතික දේ පිළිබඳ වෙයි. එම ආධ්‍යාත්මික හමු භක්ති මාර්ගය සඳහාය. මෙහි ආධ්‍යාත්මික පියා පැමිණ ඔබ ආධ්‍යාත්මක භූතාත්මයන්ට විස්තර කර දෙයි. මේ නිසයි දරුවන්ට දැනෙන්නේ එය ජීවාත්ම සත්තා විඥ්ඥානයට පැමිණීමේ උත්සාහයක් බව. ජීවාත්ම සත්තාවන් වන අප පියාගෙන් උරුමය ලබා ගනී. පියෙකුගේ දරුවන් නියතයෙන්ම පියාගේ තත්ත්වයට උරුමකම් ලබයි. ලක්ෂ්මි සහ නාරායන ද ශාරීරික අයයි. ඔවුන්ගේ දරුවන් ද උරුමය ලබන්නේ ඔවුන්ගේ භෞතික පියාගෙනි. මෙය අසහාය දෙයකි. සත්

යුගයේ දීද, එය භෞතිකය. එහිදී ඔබ කියන්නේ නැහැ ඔබ ආධ්‍යාත්මි පරම පියාගෙන් උරුමය ලැබුවා කියා. ශරීර අවධානය බිඳී යා යුතුයි. මා ජීවාත්ම සත්තාවක් වන අතර පරම පියා සිහිකළ යුතුය. භාරතයේ මේ පුරාණ යෝගය සිහිපත් කෙරේ. ''යාද්'' (ස්මෘතිය) යන වචනය හින්දි පදයකි. මෙකල මෙම ඥානය ඔබට දෙන්නේ කවුද? කිසිම මනුෂ්‍යයෙක් එය නොදනී. උපතක් උපතක් ගානේ මිනිසුන් තවත් මිනිසුන් හා සංවාදයේ යෙදුණි. දැන් ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන් සමඟ සංවාදයේ යෙදේ. පරම ආධ්‍යාත්මික භූතාත්මය කතා කරන අතර මෙයට අධ්‍යාත්මික ඥානය යැයි කියන්නේ ඒ නිසාය. ඔවුන් ගීතාව ආධ්‍යාත්මික ඥානය සේ සලකන නමුත් එහිදී ඔවුන් සඳහන් කරන්නේ ශාරීරික කෙනෙක් වූ ක්‍රිෂ්ණාගේ නමය. පරම පියා මෙසේ කියයි කිසිඳු මනුෂ්‍යයෙකුට මෙම ඥානය තිබිය නොහැකියි. කවුරු හෝ ඔබ හා වාදයට පැටළුණුහොත් ඔහුට කියන්න ඔහුගේ ඥානය භක්තියම බව. එය මනුෂ්‍යයින් විසින් ලියන ලද ලේඛණයකින් ගත් එකකි. ඥාන සාගරය වන එකම පරම පියාට පමණි මෙම සත්‍ය ඥානය ඇත්තේ. ඔහු විසින්ම ඔබට දැන් ඥානය දෙයි. ඔහුට කියන්නේ පරම පිතා කියාය. එම අශරීරික කෙනා වන්දනීයයි. වෙනත් අශරීරික අය වන්දනා කළොත් ඔවුන්ද ඔහුගේ දරුවන්ය. මිනිසුන් මැටියෙන් කුඩා ශිව පිළිම සාදා වන්දනා කරයි. ඔවුන් බලි යාගයක් තනයි. ඔබ දන්නවා පරම පිතා, පරමාත්මා සිටින්නේ අශරීරික ලෝකයේ බව. අපගේ ද නිවහන එයයි. ඥාන සාගරයම පැමිණ අප සැම කෙනෙකුටම ඥානය දී ගැලවීම ලබා දෙයි. ඔහු වූ කලී ඉතා දුර අභිබවා සිටින පරම පිතා, පරමාත්මාය. සොයුරන් වන අනෙත් සියලුම ජීවාත්ම සත්තාවන්ට ඉටු කළ යුතු චරිත කොටසක් ලැබී ඇත. එවිට ඔවුන් ශරීර ලබා සොයුරන් හා සොයුරියන් බවට පත් වේ. සියලුම ජීවාත්ම සත්තාවන් එකම පියාගේ දරුවන්ය. ජීවාත්ම සත්තාවක් දෙව්ලොව ශරීරයක් ගත් විට සතුට ලබන අතර, අපායේදී දුක ලබයි. මෙසේ සිදුවන්නේ ඇයි? ඥානය හා භක්තිය යැයි දෙකක් විස්තර කෙරේ. එය දහවලයි. මෙය රාත්‍රියයි. ඥානය සතුට ගෙනෙන අතර භක්තිය දුක ගෙන දෙයි. නාටකය නිම වී ඇත්තේ මෙසේය. සතුට සහ දුක පරමාත්ම දෙවියන් ගෙන් ලැබෙන්නක් නොවේ. මිනිසුන් අසතුටට පත් වූ කළ පමණක් දෙවියන්ට අඬගසයි. ඔවුන් දන්නවා ඔහු සතුට දානය කරන්නා බව. ඉන්පසු, ඔවුන්ගේ සතුටු කාලය අවසන් වූ කල රාවණ් නිසා පාප පහෙන් දුක ආරම්භ වෙයි. මෙය ඉතා නිවැරදිව තේරුම් ගත යුතු නාටකයකි. අධ්‍යාත්මික ඥානය යනු මෙයයි. අන් සියල්ල භෞතික දේ පිළිබඳ දැනුමයි. අප ඒවා ඇසිය යුතු නොවේ. අපට මෙම අණඥාව ලැබී ඇත අශරීරික පරම පියා වන මට පමණක් ඇහුම්කන් දෙන්න. පරම පියා මෙසේ කියයි පාපයන් නවතන්න. අප පරම පියා වන පරමාත්ම දෙවියන්ට පමණක් ඇහුම්කන් දෙන අතර ඔබ ඇහුම්කන් දෙන්නේ මනුෂ්‍යයින්ටය. එහි වෙනස දිවා රෑ මෙනි. බොහෝ උගත් අය පවා ආගමික ලේඛණ හදාරයි. අපද ඒවා බොහෝ දුරට හදාරා ඇත. පරම පියා වූ පරමාත්ම දෙවියන් දැන් මෙසේ කියයි ඔබට බොහෝ ගුරුන් සිට ඇත. දැන් ඔවුන් සැම දෙනා අතහැර මා කියන දේ අහන්න. දෙවියන් අශරීරික වන අතර ඔහුගේ නම ශිවාය. අප දැන් ඔහුට සවන් දෙමු. පරම පියා ඔහු විසින්ම ඔහුගේ හැඳින්වීම කර දෙන අතර ඔහුගේ නිර්මාණයේ මුල, මැද හා අග ගැනද හැඳින්වීමක් කරයි. ඉතින් අප ආගමික ලේඛණ වලට කන් දෙන්නේ ඇයි? අප ඔබට අධ්‍යාත්මික ඥානය කියා දෙයි. ඔබට අවශ්‍ය නම් එයට ඇහුම්කන් දෙන්න. කිසිඳු පටලැවිලි ප්‍රශ්නයක් නැත. මුළු ලෝකයම එක පැත්තක වන අතර ඔබගේ සිටින්නේ ඉතා ස්වල්පයකි. පරම පියා මෙසේ කියයි මාව සිහි කර ඔබ මත ඇති පව් බර ඉවත් කළ විට ඔබ පිරිසිඳු බවට පත් වේ. පිරිසිඳු බවට පත් වන අය පාරිශුද්ධ ලෝකය හිමි කර ගනී. වියපත් ලෝකය දැන් වෙනස් විය යුතුයි. කලි යුගයට පසු සත් යුගය ආ යුතුව ඇත. සත් යුගය වූ කලී පිරිසිඳු ලෝකයයි. මිනිසුන් මට අඬගසා ලෝකය පිරිසිඳු කිරීමට යැයි කියන්නේ කළියුග කාලයේ දී පමණි. ඉතින් මම පැමිණියෙමි. මා පමණක් නිරතුරුවම සිහි කරන්න! ලෝකය දැන් වෙනස් වෙමින් තිබේ. මේ ඔබේ අවසන් උපතයි. යක්ෂ රජ දහන වන වියපත් ලෝකය විනාශ වී යන අතර රාම රාජ්‍යය ස්ථාපනය වෙමින් තිබේ. මේ නිසයි ඔබ ගෙදර සිටින ගමන්ම ඔබේ අවසාන උපතේ දී මෙසේ නෙළුම් මලක් සේ පාරිශුද්ධ බවට පත් විය යුත්තේ. මේ දැන් ඇත්තේ විෂ සාගරයයි. නෙළුම් මල ජලයෙන් ඉහළට මතු වී තිබේ. එමනිසා, ඔබ රජ දහනක් සාදයි. මුළු ලොවම වෙනසට ලක් විය යුතුයි. ආගම් වල නිර්මාතෘවරු නිකම්ම ඔවුන්ගේ ආගම පමණක් ස්ථාපනය කරයි. මුලදී ඔවුන් පිරිසිඳු වුවද ඉන්පසු අපිරිසිඳු බවට පත් වේ. එකම සත්ගුරු පමණක් ගැලවීම ලබා දෙන්නාය. මනුෂ්‍යයින් ගැලවිම වුවමනා වූ කල ගුරුන් වෙත යයි. ආධ්‍යාත්මික පරම පියා මේ ඥානය ඔබට දෙන්නේ බොහෝ පාප තිබෙන කලය. ඔබ භක්තියේ ඵලය වූ ඥානය පරමාත්ම දෙවියන්ගෙන් ලබයි. පරමාත්ම දෙවියන් වන පරම පියා ඔබට භක්තිය කිරීමට නොඋගන්වයි. ඔහු ඔබට දෙන්නේ ඥානයයි. ඔහු මෙසේ කියයි මා පමණක් නිරතුරුව සිහි කළ විට ඔබේ පව් අතුරුදන් වේ. පිරිසිඳු බවට පත් වීමට වෙනත් ක්‍රමයක් නැත. නව ලෝකයේ දී, සියලු දෙනා දෙව්ලොව වැසියන්ය. දැන්, වියපත් ලෝකයේ දී සැම දෙනා ම අපාය වැසියන් වන අතර පරම පියා ඒ නිසා මෙසේ කියයි මා සැම කෙනෙක්ම නංවාලීමට පැමිණියෙමි. මා

පැමිණ මෙම අධ්‍යාත්මික ඥානය දෙමි. පරම පියා ඔහු විසින් ඔහුගේ ම හැඳින්වීම මෙසේ කරයි මා ඔබේ පරම පියාය. දැන් එය අපායයි. නව ලෝකයට කියන්නේ දෙව්ලොව කියාය. ඔබ කෙසේ ද කියන්නේ දෙව්ලොවත් අපායත් එක විට මෙහි තිබෙයි කියා. බොහෝ ධනය ඇති අය ඔවුන් සිටින්නේ දෙව්ලොව යැයි කියයි. දෙව්ලොව තිබෙන්නේ නව ලෝකයේය. එය මෙහි ඇති වන්නේ කෙසේ ද? මේ නිසයි අප මනුෂ්‍යයින්ට ඇහුම්කන් නොදෙන්නේ. පරම පියා මෙසේ කියයි ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් බවට පත් වීමට පතනවානම්, මා පමණක් ම නිරතුරුව සිහියේ තබා ගන්න. මෙම ඥානය දවස පුරාම ඔබේ බුද්ධිය තුළ රඳවා ගන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. එකම එක පරම පියාගෙන් පමණක් ආධ්‍යාත්මික දේට ඇහුම් කන් දෙන්න. කිසිවක් ගැන කිසිවෙක් සමඟ විවාද නොකරන්න.
2. ජීවාත්ම සත්තා විඥානයට පත් වීමට උත්සාහ කරන්න. සතෝප්‍රධාන් බවට පත් වීම සඳහා පරම පියාගේ ස්මෘතියේ දිගටම සිටින්න.

**වරදානය:** පරම පියාගේ හස්තය සහ ඔහුගේ ඇසුරේ අවධානය තුළින්, ඔබ අපහසු දේ පහසු කර, කරදර කණස්සලු වලින් නිදහස් වේවා.
ඔබගේ හස්තය වැඩිමහල් කෙනෙකුගේ හස්තයේ තිබෙන විට, ඔබගේ මනෝ ස්ථිතිය කරදර සහ කණස්සලු වලින් නිදහස් වනවා. ඒ අන්දමින්ම සෑම ක්‍රියාවක්ම සිදු කරන අතර බාප්දාදා ඔබ සමඟ සිටින බවත් මෙම අලෞකික දිවියේ ඔබගේ හස්තය, ඔහුගේ හස්තයේ ඇති බවත් සෑම විටම සලකන්න. එනම්, ඔබගේ ජීවිතය තිබෙන්නේ ඔහුගේ අතේය, එබැවින් වගකීම දරන්නේ ඔහුය. ඔබගේ සියලු බර, පියා මත දමා, සැහැල්ලු වන්න. බරක් ඉවත් කර, අපහසු දේ පහසු කරන ක්‍රමය වන්නේ, පරම පියාගේ හස්තය සහ ඇසුර තිබීමයි.

**පාඨය:** ඔබගේ උත්සාහවල අවංක බව ඇති විට ඔබ බාප්දාදාගෙන් වැඩිපුර උපකාර අත්විඳියි.

***** ඕම් ශාන්ති *****

**මාතේශ්වරීගේ අමිල වදන්.**

**1. ජීවිතයේ පදනම වන්නේ ගයාන්, යෝගාව සහ දිව්‍යමය ගුණදම් ධාරණය කරගැනීමයි.**

පරම පියා, පරමාත්ම ජීවයෙන් ඔබට ඥානය ලැබෙන බවට විශ්වාසය ඔබට තිබේ. ඔබගේ උත්සාහයේදී මෙම ඥානයේ ඔබ සම්පූර්ණ අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු තුනක් තිබේ. පළමුව යෝගාවයි - අපගේ පාපයන් විනාශ වන පරමාත්ම දෙවියන්ගේ නිරන්තර ස්මරණය. දෙවැන්න ඥානයයි ලෝකයේ මුල, මැද, අවසානය සහ බ්‍රහ්මාන්ද් කුමක්ද? මෙම ඥානය තිබෙන විට පමණයි අපගේ ජීවිත වල ප්‍රායෝගික පරිවර්ථනයක් තිබී අප වෙනුවෙන් හොඳ ප්‍රතිලාභයක් නිර්මාණය කරගැනීමට අපට හැකි වන්නේ. තුන්වන කරුණ වන්නේ සියලු ගුණධර්ම වලින් පිරිපුන් දිව්‍යමය කලා 16කින් සම්පූර්ණ වීමේ අපගේ සුදුසුකම. අපට දේවතාවන් විය හැක්කේ එවිට පමණයි. ඇවිදින විට, එහෙ මෙහෙ යන එන විට සහ කන බොන විට, මෙම කුරුණු තුනට අවධානය යොමු කිරීම අවශ්‍යයි. ඥානයේ බලය, යෝගා බලය සහ දිව්‍යමය ගුණදම් ධාරණය කරගැනීමේ බලය අපට තිබෙන්නේ මෙම එක උපතෙදි පමණයි. මේ තුනම එකිනෙකට සම්බන්ධයි. ඥානය නොමැතිව අපට යෝගාවේ සිටීමට නොහැකි අතර යෝගාවේ නොසිට, අපට දිව්‍යමය ගුණදම් ධාරණය කර ගත නොහැක. අපගේ ජීවිත පදනම් වී ඇත්තේ මේ කරුණු තුන මතයි, මන්ද අපගේ පාප ගිණුම් අවසන් කර යහපත් ක්‍රියා කිරීමට හැකි වන්නේ එවිට පමණයි. මෙය දේවමය ජීවිතයක් ලෙස හැඳින්වෙයි.

**2. භාරතයේ පෞරාණික යෝගාව උගන්වනු ලබන්නේ පරමාත්ම දෙවියන් විසිනි.**

අපගේ මෙම දේවමය යෝගාව, පෞරාණික යෝගාව ලෙසින් භාරතයේ සුපතලයි. මෙම යෝගාව, අවිනාශී යෝගාව ලෙස හැඳින්වෙන්නේ ඇයි? මන්ද එය උගන්වනු ලබන්නේ අවිනාශී පරම පියා, පරමාත්ම ජීවය විසිනි. වෙනත් මනුෂ්‍යා ජීවාත්මද යෝගා උගන්වන නමුත්, යෝගා ආශ්‍රම විවෘත කරන්නේද මේ නිසයි, නමුත් ඔවුන්ට මෙම පෞරාණික යෝගාව ඉගැන්විය නොහැක. එවන් යෝගා තිබෙයි නම්, එම බලය කොහේද? දිනෙන් දින භාරතය තව තවත් දුර්වල වනවා, ඔවුන්ගේ යෝගාව අවිනාශී නොවන බව මින් පෙනෙයි. මෙම යෝගාව ඉගැන්විය හැක්කේ, ඔබ යෝගාවේ සිටින ඒකායන කෙනාට පමණයි. අප අන් අය සමඟ යෝගාවේ නොසිටිය යුතුයි, එබැවින් ඔවුන් අපට උගන්වන්නේ කෙසේද? මෙම කාර්යය සිදු කළ හැක්කේ පරමාත්ම දෙවියන්ට පමණයි. අපට රහස කියා දීමට හැකි වන්නේ ඔහුට පමණයි, නමුත් වෙනත් අය නොකඩවා පවසන්නේ ඔවුන් අපට යෝගාව උගන්වන්නම් කියාය. අපට ඉපැරණි යෝගාව උගන්වා, දේවතා රාජධානියේ සූර්ය සහ චන්ද්‍ර වංශික රජ පෙළපත් ස්ථාපිත කළ හැක්කේ පරමාත්ම දෙවියන්ට පමණක් බව අප දන්නවා. සෑම කල්පයකදීම පරමාත්ම දෙවියන් පැමිණ අපට මෙම පෞරාණික යෝගාව උගන්වනවා. ඔහු පවසන්නේ අහෝ ජීවාත්මයනි, පරමාත්ම දෙවියන් වන මා සමඟ නිරන්තර යෝගාවේ සිටින්න, එවිට ඔබගේ පාපයන් විනාශ වෙයි. අච්චා.